# ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
# பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
# OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண ரபை கட்டிடத் தொகுதி, 4ம்மாடத "ஆ" ஹரிச்சந்திரா மாவத்த. அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரனை / Inquiries: 025-2235790
Fax : 025-2224914
E-mail csncpc@gmail.com


මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/11/3-1
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.03. 04

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 02/2024

සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත.

<u>රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධයෙන් විගණනය විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස්.</u>

උතුරු මැද පළාත් සභාවට අයත් වාහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට අමතර වශයෙන් පහත සඳහන් උපදෙස් පරිදි ද සියළුම ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

01. දෛනික ධාවන සටහන් පිළිබඳ ඉදිරිපත් කරනු ලබන මාසික සාරාංශයන් ඊළඟ මාසයේ 05 වන දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

02. වාහන දිගු කාලීනව ගාල් කිරීමට පෙර සෝදා පිරිසිදු කර හෝ සේවා කර මළ නොබැඳීමට ඔයිල් ගල්වා ආරක්ෂිතව ගාල්කිරීමට කටයුතු කළ යුතුය. මේ මඟින් වාහන වෙනත් රජයේ ආයතනයක් වෙත භාරදෙන තෙක් හෝ අපහරණය සිදු කරන තෙක් එම වාහන මළ බැඳී අබලන් වීම වලක්වා ගැනීමට අදාළ කටයුතු කිරීම කළ යුතුය.

03. වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මගේ අංක NCP/CS/FD/08/ චක්‍රලේඛ හා 2017.08.18 දිනැති ලිපියේ 08 වන වගන්තියට අනුව සහ මුල්‍ය රෙගුලාසි අනුව කටයුතු කල යුතුය.

04. වාහන අලුත්වැඩියා කිරීමේදී අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පෞද්ගලික අවධානය යටතේ සිදු කළ යුතුය. එකම අලුත්වැඩියාව නැවත නැවත කිරීමට සිදු වන්නේ නම් ඒ පිළිබඳව ද ඔබගේ අවධානය යොමු කළ යුතු අතර වාහන අලුත්වැඩියාවන් වෙනුවෙන් වියදම් දැරීමේදී පසු විපරමක් සිදුකළ යුතුය.

05. ධාවනය සඳහා යොදා ගනු ලබන රජයේ වාහන සඳහා අදායම් බලපත්‍ර ගාස්තු අය කිරීමකින් තොරව නිකුත් කරනු ලබන අතර ධාවනය සඳහා යොදාගනු ලබන සියළුම වාහන සඳහා නිසි කාලය තුළ ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

06. උතුරු මැද පළාත් සභාව සතු වාහන සම්බන්ධයෙන් මගේ අංක එන්සිපි/සිඑස්/එෆ්ඩී/08/චක්‍රලේඛ හා 2017.08.18 දිනැති පළාත් සභාව සතු හා පළාත් සභා රාජකාරි සඳහා වෙනත් ආයතන වෙතින් ලබා දී ඇති මොටර් රථ වාහන භාවිතය , පරිපාලනය හා නඩත්තු කටයුතු සම්බන්ධ ලිපියේ 1.7 වගන්තිය යටතේ සෑම වර්ෂයකම ජනවරි මස 31 වන දිනට ආයතනය සතු වාහන සම්බන්ධ තොරතුරු ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද බොහෝ ආයතන තොරතුරු ලබා නොදෙන බව නිරික්ෂණය වේ. එබැවින් සෑම වර්ෂයකම ජනවාරි 31 දිනට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2023/07 හි 09 වගන්තිය ප්‍රකාරව රථයේ වර්තමාන තත්ත්වය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

07. ධාවන තත්ත්වයෙන් ඉවත් කරන ලද වාහන විධිමත් ක්‍රමවේදය යටතේ ඉවත් කළ යුතු බැවින් සෑම කාර්යාලයකම ධාවන මට්ටමේ නොමැති ගාල් කර ඇති වාහන යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය සහිතව අපහරණය කිරීම සඳහා අදාළ තොරතුරු සෑම වර්ෂයකම මැයි මස 31 දිනට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට සියළුම ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. මෙහිදී වාහනය අපහරණය කිරීමට සුදුසු පරිදි අයිතිය උතුරු මැද පළාත් සභාව සතු විය යුතු අතර ලියාපදිංචි සහතිකයේ සහ භෞතිකව පවතින පරස්පරතාවයන් නිවැරදි කර ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතුය.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත - 01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති අනුරාධපුර — දැ.පි.
02.ප්‍රධාන අභ්‍යාන්තර විගණක, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත — දැ.පි.